# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2257/32 - 2021 දෙසැම්බර් මස 08 වැනි බදාදා - 2021.12.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

### පුපුරන ද්‍රව්‍ය ආඥාපනත (සංශෝධන)

1956 අංක 21 දරන පුපුරන ද්‍රව්‍ය ආඥාපනතේ 33 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති හා ආරක්ෂක අමාත්‍ය ගෝඨාභය රාජපක්ෂ වන මා විසින් සාදන ලද නියෝග.

**ගෝඨාභය රාජපක්ෂ,**
ජනාධිපති,
ආරක්ෂක අමාත්‍යාංශය.

2021 නොවැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2016.09.23 දිනැති අංක 1985/37 දරන *අති විශේෂ ගැසට් නිවේදනය* මගින් සංශෝධිත, අංක 23/5 දරන 1979.02.13 දිනැති *අති විශේෂ ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශයට පත් කරන ලද, 1979 පුපුරන ද්‍රව්‍ය නියෝගවල සඳහන් පස්වන උපලේඛනයේ 08 වන ඡේදයේ සඳහන් අන්තරායකාරී නෛකා භාණ්ඩ නිෂ්කාශනය සඳහා අවසර පත්‍ර සඳහා වූ අදාළ ගාස්තු සඳහන් වන උපලේඛනය වෙනුවට පහත දැක්වෙන නව උපලේඛනය ඇතුළත් කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ.


1 A – G 35520 — 15 (2021/12)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**අවසර පත්‍ර සඳහා ගාස්තු**

| *අ/අ* | *අන්තරායකාරී නෞකා භාණ්ඩ නිෂ්කාශන සම්බන්ධ අවසර පත්‍ර* | *අදාළ අවසර පත්‍ර ගාස්තුව රුපියල්* |
|---|---|---|
| 1 | (නාවික හා ගුවන්) නිෂ්කාශන නියෝජිතයන් සඳහා ඉවත් කිරීමේ අවසරපත්‍ර | රු. 5,000.00 |
| 2 | (නාවික හා ගුවන්) නිෂ්කාශන නියෝජිතයන් සඳහා ඉවත් කිරීමේ හා නැව්ගත කිරීමේ අවසරපත්‍ර | රු. 5,000.00 |
| 3 | (නාවික හා ගුවන්) නිෂ්කාශන නියෝජිතයන් සඳහා අන්තර් ප්‍රවාහන අවසරපත්‍ර | රු. 5,000.00 |
| 4 | (නාවික හා ගුවන්) නිෂ්කාශනය සඳහා අවසරපත්‍ර | රු. 5,000.00 |
| 5 | ගිනි අවි සමග ශ්‍රී ලංකා මුහුදු තීරයට ඇතුලුවන නැව් සඳහා අවසරපත්‍ර ගාස්තුව | රු. 10,000.00 |

02. ඉහත සඳහන් සංශෝධන නියමයන් 2022 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

EOG 12 - 0073

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.